# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 12
# දරන සිවිල් නඩු විධාන සංග්‍රහ
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1973 මාර්තු මස 30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ
අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 12 දරන
සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 20 වන දින]

එල්.ඩී.—ඕ. 25/69.

**සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 12 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 30අ වන වගන්තිය, එහි (1) වන උපවගන්තියෙහි "නියමිත ආකෘතියෙහි සාරානුකූලව" යන වචන වෙනුවට "පළමුවන උපලේඛනයේ අංක 11අ දරන ආකෘතියෙහි සාරානුකූලව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 101 වන අධිකාරයේ 30අ වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ අංක 11 දරන ආකෘතියට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

"අංක 11අ.

(30අ වන වගන්තිය)

කැඳවීම් නියෝග බාර කරවීම සඳහා ලිපිනය ලියාපදිංචි කිරීම පිණිස ඉල්ලීම

........................ඉඩම් ලේඛකාධිකාරී වෙත ය.

............(සම්පූර්ණ නම සහ ලිපිනය)............ වන මම, මෙහි පහත 'ආ' කොටසෙහි සඳහන් පත් ඉරුවෙහි (හෝ පත් ඉරුවල) ලියාපදිංචි කරනු ලැබ ඇති උකස සම්බන්ධ යම් නඩුවක කැඳවීම් නියෝග බාර කරවීම සඳහා ලිපිනය වශයෙන් මෙහි පහත 'අ' කොටසෙහි සඳහන් ලිපිනය මෙහි පහත 'ආ' කොටසෙහි සඳහන් පත් ඉරුවෙහි හෝ පත් ඉරුවල හෝ ඊට සහබද්ධ වශයෙන් ලියාපදිංචි කරන ලෙස සිවිල් නඩු විධාන සංග්‍රහයේ 30අ වන වගන්තිය යටතේ ඉල්ලා සිටිමි. මට හිමිකම් ලැබුණු සාධන පත්‍රයේ විස්තර මෙහි පහත 'ඇ' කොටසේ දැක්වේ.

'අ'

බාර කරවීම සඳහා ලිපිනය

(කැඳවීම් නියෝග යැවිය යුතු නීතිඥයාගේ හෝ තැනැත්තාගේ නම.)

(ලංකාවෙහි ඇති සම්පූර්ණ තැපැල් ලිපිනය)

නිදර්ශනය : එච්. ජෝන් පෙරේරා,
අංක 18, මැලිබන් වීදිය,
පිටකොටුව,
කොළඹ.

'ආ'

ලිපිනය ලියාපදිංචි කළ යුතු පත් ඉරුව (හෝ පත් ඉරු)

වෙළුම :......................

පත් ඉරුව :......................

වෙළුම :......................
පත් ඉරුව :......................

'ඇ'

ඉල්ලුම්කරුට හිමිකම් ලැබුණේ යම් සාධන පත්‍රයක් යටතේ ද ඒ සාධන පත්‍රය පිළිබඳ විස්තර

(1) ඔප්පුවේ අංකය හා දිනය :......................

(2) ලියා සහතික කළ නොතාරිස්ගේ නම : ......................

(3) ඔප්පුව ලියාපදිංචි කරනු ලැබූ කාණ්ඩය සහ පත් ඉරුව :......................

2. බාර කරවීම සඳහා කලින්..............කාණ්ඩයේ.................... පත් ඉරුවේ ..............දින ලියාපදිංචි කරනු ලැබූ මගේ ලිපිනය මෙයින් අවලංගු කරනු ලබන බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

3. ලියාපදිංචි කිරීමේ ගාස්තුව වන රුපියල් ..............මුදල මුද්දරවලින් මෙහි බහා එවා ඇත.

.............................."

(ඉල්ලුම්කරුගේ අත්සන).